කොළඹ විශ්වවිද්‍යාලය
ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය

# ව්‍යාපාරික ඉංග්‍රීසි පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව

## 2024 මාර්තු (32 වැනි කණ්ඩායම)

ව්‍යාපාරික පරිසරයක් ඇතුළත වඩාත් සාර්ථකවීම උදෙසා තම ඉංග්‍රීසි භාෂා නිපුණතාව වැඩි දියුණු කරගැනීමට උනන්දුවක් දක්වන අය සඳහා මේ පාඨමාලාව සැලසුම් කර තිබේ.

**නියමිත විෂය ඒකක -**

- ව්‍යාපාර සඳහා ඵලදායී සන්නිවේදනය
- ව්‍යාපාරික ලිපි, විද්‍යුත් ලිපි සහ වාර්තා ලිවීම
- දුරකථන ආචාර ධර්ම
- බහු මාධ්‍ය භාවිත ප්‍රස්තුතිකරණ
- සාකච්ඡා කුසලතා
- රැස්වීම් පැවැත්වීම සහ සහභාගී වීම
- සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සහ මුහුණ දීම

**පාඨමාලා කාලය** - මාස හතරකි (හෝරා 64)
**පාඨමාලා මාධ්‍යය** - ශාලාගත දේශන

**පංති පැවැත්වීම -**

| **සෙනසුරාදා** | **ඉරිදා** |
|---|---|
| පෙ.ව. 08.00 - ප.ව. 12.15 | පෙ.ව. 08.00 - ප.ව. 12.15 |
| ප.ව. 01.00 - ප.ව. 05.15 | |

පංති සඳහා වේලාව වෙන් කිරීමේ දී මුලින් ලියාපදිංචි වූ අයට ප්‍රමුඛතාව හිමි වේ.
පාඨමාලා ගාස්තුව (තෝරා ගැනීමේ විභාගයෙන් පසු ගෙවිය යුතු ය.) -
ශ්‍රී ලාංකේය ශිෂ්‍යයන් සඳහා රු. 35,000/-
SARRC රටවල ශිෂ්‍යයන් සඳහා USD 200
ශ්‍රී ලාංකික නොවන අනෙක් ශිෂ්‍යයන් සඳහා USD 300
අයදුම්පත් ගාස්තුව - රු. 1000/-

**අයදුම් කිරීමේ පිළිවෙළ -**

1. **ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශයේ (DELT) ව්‍යාපාර ඉංග්‍රීසි සංවර්ධන අරමුදලේ අංක 304027500005 දරන** ගිණුමට බැර වන පරිදි ඕනෑම මහජන බැංකු ශාඛාවකට රු. 1000/- ක් ගෙවා ලදුපත ලබාගන්න.
2. https://arts.cmb.ac.lk/delt/index.php/course/ යන සබැඳියෙහි දැක්වෙන මාර්ගගත අයදුම්පත සම්පූර්ණකොට අයදුම්කරුගේ නම පැහැදිලිව සටහන් කළ බැංකු ලදුපතෙහි පිටපතක් අමුණන්න. අනතුරුව මාර්ගගත ක්‍රමයට අයදුම්පත යොමු කරන්න.
3. අයදුම්පත් හා පාඨමාලා ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.
4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2024 පෙබරවාරි 12 වැනිදා, සඳුදාය.

ශිෂ්‍යයන්ගේ ප්‍රවීණතා මට්ටම අනුව සහතිකපත්‍ර සහ උසස් සහතිකපත්‍ර යන මට්ටම දෙකෙන් පංති පැවැත්වේ. අයදුම්පත් යොමු කරන විට අයදුම්කරුවන් වයස අවුරුදු 16 ක් හෝ ඊට වැඩි විය යුතු ය.

2024 පෙබරවාරි 18 වැනි දා, පෙ.ව. 9.30 ට තෝරාගැනීමේ විභාගය පැවැත්වෙනු ඇත.
විභාග ස්ථානය මතු දැනුම් දෙනු ලැබේ.

**වැඩි විස්තර සඳහා වැඩ කරන දිනවල පෙ.ව. 9.00 ත් ප.ව. 4.00 ත් අතර 0112506705 අමතන්න.**
**විද්‍යුත් තැපෑල: bizeng@delt.cmb.ac.lk**

**ලේඛකාධිකාරී**

tamilguru.lk